# ව්‍යාපාර සඳහා වූ උපකාරක සේවා ප්‍රවාහනය

## AAT අදියර I

BEN - ව්‍යාපාර පරිසරය


රංග ජයනන්ද
B.Sc. (Business Administration) Sp. (USJP)



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

JMC vLearning
"your virtual learning partner"

# ව්‍යාපාර සඳහා වූ උපකාරක සේවා ප්‍රවාහනය

තරංග ජයනන්ද

## ප්‍රවාහනය



නිශ්චිත ස්ථානයක සිට තවත් ස්ථානයකට පුද්ගලයින් සහ භාණ්ඩ ගෙන යාම, නැතහොත් අවකාශ තරණය කිරීම ප්‍රවාහනයයි

එනම් එක් ස්ථානය සිට තවත් ස්ථානයකට විවිධ මාධ්‍යය භාවිතා කරමින් පුද්ගලයින් හෝ ද්‍රව්‍ය ගෙනයාමේ ක්‍රියාවලිය ප්‍රවාහනයයි.

©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## ප්‍රවාහනය සමාජීය අවශ්‍යතාවයක් ලෙස සැලකීමට හේතු

- මානව සම්බන්ධතා ඇතිකර ගැනීම සඳහා උපකාරී වීම
- පුද්ගල සංවර්ධනය ඇතිකර ගැනීමට උපකාරී වීම
- දේශීය හා අන්තර්ජාතික සම්බන්ධතාවයන් පවත්වාගෙන යාමට උපකාරී වීම
- විවිධ ගවේෂණ කටයුතු වලට උපකාරී වීම
- යුධ කටයුතු සඳහා උපකාරී වීම.

## ප්‍රවාහනයේ ප්‍රයෝජන/වැදගත් වන ආකාරය

නිෂ්පාදකයාට

- අමුද්‍රව්‍ය කලට වේලාවට සපයා ගැනීමට
- නිමිද්‍රව්‍ය කලට වේලාවට වෙළඳපොලට ඉදිරිපත් කිරීමට
- සේවකයින් නිවැරදි වේලාවට ගෙන්වා ගැනීමට.

©JMC vLearning

වෙළෙන්දාට

- වෙළඳ ද්‍රව්‍ය කලට වේලාවට අවශ්‍ය ප්‍රමාණයෙන් ගෙන්වා ගැනීමට
- පාරිභෝගිකයාට අඛණ්ඩව භාණ්ඩ හා සේවා බෙදා හැරීමට
- ව්‍යාපාරික සබඳතා පැවැත්වීමට
- වෙළෙඳපොළ ව්‍යාප්තියට.

පාරිභෝගිකයාට

- නියමිත වේලාවට වෙළඳපොළට ලඟා වීමට
- අවශ්‍ය භාණ්ඩ කලට වේලාවට නිවස වෙත රැගෙන යාමට
- ඕනෑම රටක භාණ්ඩ තම රටේ දී පරිභෝජනයට අවස්ථාව සලසා ගැනීම
- ඕනෑම ස්ථානයකින් භාණ්ඩ මිලදී ගැනීමේ අවකාශය ලැබීම.

©JMC vLearning

## ප්‍රවාහනය ආර්ථිකයට වැදගත් වන ආකාරය

- සේවා නියුක්තිය වර්ධනය වීම
- ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීම
- විදේශ වෙළඳාම වර්ධනය වීම
- ජාතික නිෂ්පාදිත වර්ධනය වීම
- ආර්ථික වර්ධනය සහාය වීම.

## ප්‍රවාහන පද්ධතියක මූලිකාංග

1. මාර්ගය (Way)
   - ප්‍රවාහනය සඳහා භාවිතා කරන විවිධ මාර්ග වේ
   මහා මාර්ග,දුම්රිය මාර්ග,ජල මාර්ග,ගුවන් මාර්ග



©JMC vLearning



2. මාධ්‍යය (Mode)
   - විවිධ මාර්ගවල ධාවනය වන වාහන වේ
   මෝටර් රථ,දුම්රිය,නැව්,ගුවන් යානා

3. බලය (Power)
   - එක් එක් මාධ්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ඉන්ධන වර්ගය හෝ ශක්තිය වේ.
   ගල් අඟුරු,ඛණිජ තෙල්, විදුලිය,ගෑස්,හිරු එළිය,සුළඟ,සත්තුන්ගේ ශ්‍රමය, මිනිස් ශ්‍රමය



©JMC vLearning


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

3. පර්යන්තය (Terminal)

- ප්‍රවාහන මාධ්‍ය,ප්‍රවාහන කාර්යයේ දී නවතා තබන නැවතුම්පොළවල් වේ.
  බස් නැවතුම්පොළ,දුම්රිය ස්ථානය,ත්‍රී රෝද රථ නැවතුම්පොළ/වරාය,/ගුවන්තොටුපල



## හොඳ ප්‍රවාහන ක්‍රමයක ගුණාංග/කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක ලක්ෂණ

1. වේගවත් බව
   - ඉතා ඉක්මනින් කළට වේලාවට අවශ්‍ය ස්ථානයට නිෂ්පාදිත රැගෙන යාමේ හැකියාවයි.
2. සුරක්ෂිත බව
   - ප්‍රවාහනය කරනු ලබන නිෂ්පාදිත වලට හානියක් නොවී රැගෙන යාමේ හැකියාවයි

©JMC vLearning

3. පිරිවැය අවම වීම
   - ප්‍රවාහන මාධ්‍ය ලබා ගැනීමට දැරිය යුතු මූල්‍යමය අගය අඩු විට යුතු බව මින් අදහස් වේ
4. ධාරිතාව
   - ප්‍රවාහන මාධ්‍යට එකවර ගෙනයා හැකි භාණ්ඩ හා මගීන් ප්‍රමාණය කොපමණද යන්නයි
5. සුලභතාවය
   - කිසිඳු බාධාවකින් තොරව අප්‍රමාදව ප්‍රවාහන මාධ්‍ය පහසුවෙන් ලබාගැනීමට හැකියාවයි
6. නීත්‍යානුකූල භාවය / නෛතික පැවැත්ම
   - ප්‍රවාහන ක්‍රමය නීතිමය රෙගුලාසි වලට අනුකූල විය යුතුය යන්නයි (රියදුරු බලපත්‍රය, මාර්ගබලපත්‍ර, විනගරුක වීම ආදිය වේ)

©JMC vLearning

7. ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූල වීම

- භාණ්ඩ ප්‍රවාහනයේ දී මෙන්ම බෑමේ පැටවීමේ දී අනුගමනය කල යුතු යැයි පිලිගැනෙන සම්මතයන් මින් අදහස් වේ

ප්‍රමිතීන් සඳහා නිදසුන්

- ප්‍රවාහනය කල යුතු උපරිම මගීන් සංඛ්‍යාව
- අන්තර්ජාතික ගුවන් ගමන් සේවා සම්මුති
- බහාලුම් පිලිබඳ මිමි, භාණ්ඩ වල බර හා පරිමාව සම්බන්ධ මිනුම්, ඇසුරුම්කරණයේ දී, භාවිතා කරන මිනුම්
- ගමන් කල යුතු වේගය හා මාර්ග නීති.

©JMC vLearning

## ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීමට කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක දායකත්වය

- මහා පරිමාණ නිෂ්පාදන සඳහා ඉවහල් වීම මගින් නිෂ්පාදන ඉහළ යාම
- වෙළඳපොල පුළුල් වීම
- පරිභෝජනය පහසු වීම
- කලට වේලාවට භාණ්ඩ ලබා ගැනීමට හැකි වීම
- පිරිවැය අඩු වීමට හේතු වීම
- උද්ධමනය පාලනය වීමට හේතු වීම
- සේවකයින් නිසි වේලාවට ආයතනනය වෙත ලඟා වීම නිසා අක්‍රීය කාල ඇති නොවීම
- නිෂ්පාදිත නියමිත් වේලාවට වෙළඳපොල වෙත රැගෙන යාමට උපකාරී වීම.


©JMC vLearning

# ප්‍රවාහන සහ සැපයුම් සේවා

පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම සඳහා වුවමනා ඉටුකිරීම තහවුරු කිරීමේ අරමුණින් නිෂ්පාදිත නිෂ්පාදකයාගේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා කාර්යක්ෂමව හා සඵලදායීව රැගෙනයාමට අදාලව ප්‍රවාහන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පාලනය යනාදී සියලු කටයුතු මින් අදහස් වේ.

- ප්‍රවාහන හා සැපයුම් සේවා මූලික ක්‍රියාවලි 2ක් ඔස්සේ ක්‍රියාත්මක වේ.

1. සැපයුම්කරුවන්ගේ සිට නිෂ්පාදන අවස්ථාව දක්වා (Inbound Logistic)
2. නිෂ්පාදනයෙන් පසු නිෂ්පාදකයාගේ සිට අවසාන පාරිභෝගිකයා දක්වා (Outbound Logistic)




©JMC vLearning

# සැපයුම් සේවා පද්ධති වර්ග

1. සමබර වූ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති

   - අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ගේ සිට නිෂ්පාදන ආයතනය දක්වා මෙන්ම නිෂ්පාදනයෙන් පසු නිෂ්පාදන ආයතනයේ සිට පාරිභෝගිකයා දක්වාත් එක සමානව ප්‍රවාහන සේවා පවත්වාගෙන යන පද්ධති වේ

     උදා: පාරිභෝගික භාණ්ඩ සපයන ආයතන වල පද්ධති

2. නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා වූ සංකීර්ණ සේවා පද්ධති

   - අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ගේ සිට නිෂ්පාදන ආයතනය දක්වා ප්‍රවාහන කටයුතු වලට ඉතා ඉහල අවධානයක් සහිතව නිර්මාණය කල සැපයුම් සේවා පද්ධති වේ බොහෝවිට මහාපරිමාණයෙන් නිපදවනු ලබන නිෂ්පාදනාගාර වල එනම් නැව්,ගුවන්යානා නිෂ්පාදනාගාර වලට අවශ්‍ය සැපයුම් විශාල තොග වශයෙන් සැපයීම නිදසුන් ලෙස ගත හැක

©JMC vLearning



© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

3. නිෂ්පාදනයෙන් පසු අවසන් පාරිභෝගිකයා දක්වා වූ සංකීර්ණ සැපයුම් සේවා පද්ධති

- විශේෂිත වූ ක්‍රම යටතේ විශේෂ අවධානයක් සහිතව නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා ප්‍රවාහනය කල යුතු නිෂ්පාදිත ප්‍රවාහනයට, ගබඩාකරණයට, ඇසිරීම පහසුකම් සලසන සැපයුම් පද්ධති වේ. විශේෂයෙන් වහා ගිනි ඇවිලෙන සුළු, විකිරණශීලි ද්‍රව්‍ය, පුපුරණ ද්‍රව්‍ය වැනි දෑ ප්‍රවාහනයට මෙම පද්ධති වැදගත් වේ

4. නිෂ්පාදන අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහන සහිත පද්ධති

- පාර්භෝගිකයා වෙත භාණ්ඩ ලබා දීමෙන් පසුව පාර්භෝගිකයාගේ සිට නැවත නිෂ්පාදනාගාරය වෙත භාණ්ඩ ප්‍රවාහනයන් සිදු කරනු ලබන පද්ධති වේ ගෑස් සිලින්ඩර් බීම බෝතල් වැනි දෑ නැවත එකතු කිරීම මෙයට උදාහරණ වේ.

©JMC vLearning

## ප්‍රවාහනය හා සැපයුම් සේවා වල අවශ්‍යතාවය

- නිවැරදි නිෂ්පාදිත නිවැරදි ප්‍රමාණයෙන් හා ගුණත්වයෙන් නිවැරදි වේලාවට නිවැරදි ස්ථනයේ දී නිවැරදි මිලට ආරක්ෂිතව සැපයීමේ හැකියාව ආරක්ෂා කිරීමට
- ද්‍රව්‍ය මිලදී ගැනීම, තොග පාලනය, නිෂ්පාදිත සැලසුම්කරණය හා ප්‍රවාහනය යනා දී කාර්යයන් සාර්ථකව ක්‍රියාත්මක වීමට
- නිෂ්පාදන ආයතනයකට තම නිෂ්පාදනයට අවශ්‍ය ද්‍රව්‍ය නියම ප්‍රමාණයෙන් නියම ගුණත්වයෙන් නියම වේලාවට නියමුත මිලට ලබා ගැනීමේ හැකියාව ලබා දීමට
- නිෂ්පාදන ආයතනයට වෙළඳපොල පිළිබඳ පර්යේෂණ සිදුකිරීම, අවශ්‍යතා සැලසුම් කිරීම, නිෂ්පාදන මිලදී ගැනීම, හා පිරිවැය පාලනය කිරීම යනාදී කටයුතු වලදී ප්‍රවාහනය හා සැපයුම් සේවා පද්ධති වැදගත් වේ.

©JMC vLearning

## ව්‍යාපාර ආයතනයකට ප්‍රවාහනය හා සැපයුම් සේවා මගින් ලබා ගත හැකි වාසි/ප්‍රයෝජන

- අඛණ්ඩව පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමේ හැකියාව ලැබීම
- තම සියළු කාර්යයන් සැලසුම් සහගතව සිදුකිරීම මගින් නාස්තිය අපතය අවම වීමෙන් පිරිවැය අවම වීම
- තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හැකියාව ලැබීම
- යන්ත්‍ර සූත්‍ර වලින් හා සේවකයින්ගෙන් උපරිම දායකත්වයක් ලබා ගැනීමට හැකි වීම
- නිෂ්පාදිත වල ගුණාත්වය ඉහළ යාමට හේතුවක් වීම
- අපද්‍රව්‍ය පහසුවෙන් කළමණාකරණය කිරීමට හැකි වීම
- කර්මාන්තය තුල නායකයා බවට පත්වීමට යොදාගත හැකි වීම
- ව්‍යාපාර පුළුල් කිරීමේ දී ඇතිවන සංකීර්ණතා අවම වීම.

©JMC vLearning